WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**50 S I, II**

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
# கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
# General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

නාට්‍ය හා රංග කලාව (සිංහල) I, II
நாடகமும் அரங்கியலும் (சிங்களம்) I, II
Drama and Theatre (Sinhala) I, II

## නාට්‍ය හා රංග කලාව (සිංහල) II

✳ **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** විකෘති නාට්‍යය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- (i) විකෘති නාට්‍යය රචනා කොට අධ්‍යක්ෂණය කළේ කවුද? (ලකුණු 02 යි)
- (ii) එම නාට්‍යයේ පළමු මහජන දර්ශනය වේදිකාගත කළ වර්ෂය හා රඟහල කුමක් ද? (ලකුණු 02 යි)
- (iii) ඉහත නාට්‍යයේ ප්‍රියංගනී පෙනී සිටි විභාගය සහ විෂය ධාරාව කුමක් ද? (ලකුණු 02 යි)
- (iv) මෙම නාට්‍යයේ යෞවන ප්‍රශ්න නියෝජනය කරන පිරිමි චරිත **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
- (v) නාට්‍යයේ ප්‍රධාන ගැටුම ඇති වන්නේ කවර අය ගේ අපේක්ෂාවන් අතර ද? (ලකුණු 02 යි)
- (vi) විකෘති නාට්‍යයේ තේමාව කුමක් ද? (ලකුණු 02 යි)

**2.** (i) මඩු ශාන්තිකර්ම පැවැත්වීමේ අරමුණු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
- (ii) ගම්මඩුව ශාන්තිකර්මයේ උපත් කතාව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)
- (iii) ගම්මඩුව ශාන්තිකර්මයේ ඇතුළත් නාට්‍යමය පෙළපාළි **හතරක්** නම් කොට, ඉන් **එකක** දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**3.** (i) 'චරිත නිරූපණය' යනු කුමක් දැයි හඳුන්වන්න. (ලකුණු 02 යි)
- (ii) චරිත නිරූපණයේ දී වැදගත් වන කරුණු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
- (iii) චරිත ප්‍රතිනිර්මාණයේ දී නළු-නිළියන් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග විස්තර කරන්න. (ලකුණු 06 යි)

**4.** (i) 'රංගභූමි අලංකරණය' යනු කුමක් දැයි හඳුන්වා දෙන්න. (ලකුණු 02 යි)
- (ii) වේදිකා පසුතල නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
- (iii) රංගභූමි අලංකරණය සඳහා භාවිතයට ගන්නා විවිධ අමුද්‍රව්‍ය, භාණ්ඩ සහ තාක්ෂණික උපක්‍රම විස්තර කරන්න. (ලකුණු 06 යි)

**5.** (i) ප්‍රකට නූර්ති රචකයින් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 02 යි)
- (ii) නූර්ති කතා වස්තුවලට පාදක කරගත් නාට්‍ය වර්ග හෝ කතා වර්ග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
- (iii) නූර්ති රංග ශෛලියට ආවේණික ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**6.** (i) ජයලත් මනෝරත්න රචනා කොට අධ්‍යක්ෂණය කළ නාට්‍ය **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
- (ii) වෙනත් අධ්‍යක්ෂවරුන් යටතේ ජයලත් මනෝරත්න රඟපෑ නාට්‍ය **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
- (iii) ඉහත (ii) හි දක්වා ඇති නාට්‍යකරු ගෙන් සිංහල නාට්‍ය කලාවට සිදු වූ සේවය අගයන්න. (ලකුණු 06 යි)

[ හයවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**7.** පහත දැක්වෙන කථා සාරාංශය පදනම් කරගෙන ඒකාංක නාට්‍යයක් රචනා කරන්න. ඔබට කැමති පරිදි චරිතවල පුද්ගල නාම, ස්ත්‍රී පුරුෂ බව හෝ චරිත සංඛ්‍යාව වෙනස් කරගත හැකි ය.

සුනිල් දහම් පාසල් යන ගුණයහපත් ළමයෙකි. නිමල් අනවශ්‍ය දෙයට මුදල් වියදම් කරන හිතුවක්කාර ළමයෙකි. මිතුරන් වන මේ දෙදෙනා ගමනක් යන විට බිම වැටී තිබෙන මුදල් පසුම්බියක් අහුලා ගනිති. මුදල් පසුම්බියට කළ යුත්තේ කුමක් දැයි දෙදෙනා වාද කරන අතර එතැනට පොලිස් නිලධාරියෙක් පැමිණෙයි.

(i) පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා (ලකුණු 04 යි)

(ii) චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථාව ගොඩනැඟීම සඳහා (ලකුණු 04 යි)

(iii) කුතුහලය දනවන නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු 04 යි)

***

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...